# සූරා අල් ෆාතිහා (01)

# سُورَةُ الْفَاتِحَة

# Sūrat al-Fātiḥah

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

1) බිස්මිල්ලාහිර් රහ්මාන් නිර්රහීම්.

الْحَمْدُ لِلَّهِ رَبِّ الْعَالَمِينَ

2) අල්හම්දුලිල්ලාහි රබ්බිල් ආලමීන්.

الرَّحْمَٰنِ الرَّحِيمِ

3) අර් රහ්මාන් නිර්රහීම්.

مَالِكِ يَوْمِ الدِّينِ

4) මාලිකි යව්මිද්දීන්.

إِيَّاكَ نَعْبُدُ وَإِيَّاكَ نَسْتَعِينُ

5) ඉය්යාක නඃබුදු ව ඉය්යාක නස්තඊන්.

اهْدِنَا الصِّرَاطَ الْمُسْتَقِيمَ

6) ඉහ්දිනස්සිරාථල් මුස්තකීම්.

صِرَاطَ الَّذِينَ أَنْعَمْتَ عَلَيْهِمْ غَيْرِ الْمَغْضُوبِ عَلَيْهِمْ وَلَا الضَّالِّينَ

7) සිරාථල් ලදීන අන් අම්ත අලෛහිම් සය්රිල් මෞධූබි
අලෛහිම් වලධ්ධාල්ලීන්.

අල් ෆාතිහා

1) අසීමිත දයාව හා අසම සම අනුකම්පාවෙන් යුත් අල්ලාහ් ගේ නාමයෙන්.

2) සියලු පැසසුම් අල්ලාහ් ටය. (ඔහු) සකල ලෝකයම නිර්මාණය කර, සංවර්ධනය කර, සංරක්ෂණය කර, පෝෂණය කරන්නා වූද,

3) අපරිමිත අනුකම්පාව ද, අසම සම දයාවද,

4) විනිශ්චය දින අධිපති (ද වන්නේ ය).

5) (අනුකම්පාව හා දයාවද පිරි අප දෙවියනේ), ඔබවම අප නමදින්නෙමු. ඔබගෙන්ම අප පිහිට පතන්නෙමු.

6) ඔබ අපට ඍජු මාර්ගය පෙන්වා දෙනු මැනව

7) ඔබගේ අනුකම්පාව හා දයාව කාහට පහළ කලේද, ඔවුන්ගේ මාර්ගයේ යාමට සලස්වනු මැනව.

8) එය ඔබගේ කෝපයට පත් වූවන් ගිය මාර්ගයෙහිද නොව, අයහමගෙහි වූවන්ගේ මාර්ගයෙහීද නොව.